

# ගිලන් භික්ෂුන්ගේ උවටැන් මැදුර ශිල සුව අරණ

දිනක් බුදුරජාණන් වහන්සේ මහා කරුණා සමාපත්තියට සමවැදී ලෝකය දෙස බලන කල්හි ඉතා අසාධ්‍ය තත්ත්වෙයන් තුවාල කුෂ්ඨ සෑදී කාගේවත් පිළිසරණක් නැතිව සිටි පුතිගත්ත තිස්ස තෙරුන් වහන්සේ දක්නට ලැබිණි. එය බුදුන් වහන්සේගේ දින චර්යාවේ එක් අංගයකි. එදින කාට පිහිට වෙම්දෝ සිටි බුදුන් වහන්සේට පුතිගත්තතිස්ස තෙරුන් සොයාගෙන ගොස් පිහිට වීමේ අවශ්‍යතාවය තේරුම් ගත්හ. බුදුන් වහන්සේ ආනන්ද තෙරණුවන්ද කැටුව පුතිගත්ත තිස්ස තෙරුන් වහන්සේ වැඩ සිටි ආරාමයට වැඩම කළහ. පළමුව බුදුන්ම වතුර උණුකරවා බුදුන්ගේ දෑතින්ම පුතිගත්තතිස්ස තෙරණුවෝ නෑවුහ.

උන් වහන්සේ තුවාල වී ඕජස් ගලමින් තිබු ශරීරය පිරිසිදු කරවා අලුත් සිවුරක් ඇන්දවුහ. පුතිගත්ත තිස්ස තෙරණුවන්ට ප්‍රණීත දාන වේලක් පිරිනමා මනහර දම් දෙසුමක්ද බුදුන් වහන්සේ පැවැත්වුහ.

ඒ බුදුන් වහන්සේ අසරණ කාත් කවුරුත් නැතිව සිටි පුතිගත්ත තිස්ස තෙරණුවන්ට උවටැන් කළ අයුරුය. ඒ බුද්ධ කාලයේ කතාවකි. අපේ කාලයේත් එවැනි බුද්ධ පුතයකු වැඩ සිටින අතුරුගිරිය, තිසර මාවෙත් 'ශීල සුව අරණ ශි සදහම් පදනම' වෙත අපි ගියෙමු. මෑත යුගයේ වැඩ සිටින එම බුද්ධ පුත්‍රයා ගලිගමුවේ ඤාණදිප ස්වාමීණ් වහන්සේය. ධර්ම දේශකයකු ලෙස ජනතාව ගුණ ධර්මවලට හුරු කිරීම සඳහා ඉමහත් මෙහයක් සිදු කරමින් යන ඤාණදිප ස්-වාමීණ් වහන්සේගේ ශිල සුව අරණ භික්ෂු ගිලන් මධ්‍යස්ථානය පිළිබඳව සමහර විට ඔබ දන්නවා වන්නට පුලුවන. නොදන්නවා වන්නට පුලුවන. අපේ වෑයම ඒ පිළිබදව ඔබ දැනුවත් කර මෙම වටිනා සමාජ කටයුත්තට ඔබවද දායක කර ගැනිමය. කුකුළා අතින් ගත් අපි පසුගිය දිනක පාන්දරම ගලිගමුවේ ඤාණදිප හිමියන්ගේ උපන් දිනයදා විවෘත කෙරුණු ශිල සුව අරණ ගිලන් භික්ෂු මධ්‍යස්ථානය වෙත පැමිණියෙමු. නිවන් අවෙබෝධනයට වෙර දරණ භික්ෂුණ් වහන්සේලා ගිලන් වු විට ගිහි අපට වඩා අසරණ වන බව කාත් කවුරුවත් නැති වන බව අපටම සිතා බලන්නට අවස්ථාවක් අපේ දෑස් ඉදිරිපිටම ලැබී තිබේ. එවැනි අවස්ථාවක වයසට ගොස් ගිලන්ව අසරණ වන භික්ෂුන්ට නොමිලේ පතිකාර ලබාදීම පිණිස සැදැවතුන්ගේ උපකාර මත ශිල සුව අරණ ගිලන් භික්ෂු මධ්‍යස්ථානය ඉදිකර තිබේ. මේ මධ්‍යස්ථානයේ පළමු අදියර තුළ වෙනම ගිලන්කුටි පෙළක්, බුද්ධ මන්දිරයක්, දාන ශාලාවක්, සක්මන් මලුවක් ඉදිකර ඇත. ගිලන් භික්ෂුන්ට වෛද්‍ය පතිකාර පමණක් නොව අධ්‍යාත්මික දියුණුවට පහසුකම්ද සලසා තිබෙන බව අපට පෙනේ. එහිදි දිනපතා ධර්ම දේශනා, බුද්ධ වන්දනා හා ගිලන් භික්ෂුන්ට භාවනාමය කටයුතු සඳහාද මග පෙන්වීමක් ලැබී තිබේ.

ගලිගමුවේ ඤාණදිප හිමියන්ගේ මුලිකත්වයෙන් ඉදිකෙරී තිබෙන ශීල සුව අරණ ගිලන් භික්ෂු රෝහලක් ලෙස ක්‍රියාත්මක වුවත්, පන්සලකට ගියා තරම් සිතට ශාන්තියකුත් නිවසට මුලුතැන්ගෙයක් මෙන් පිරිසිදුකමකුත් දක්නට ලැබීම විශේෂිත කාරණයක් සේ දැනේ. අපි එකින් එක ගිලන් කුටි වලට යමින් ගිලන්ව ප්‍රතිකාර ලබමින් සිටින භික්ෂුන් වහන්සේලාගේ සැබෑ කතාවට එබිකම් කරන්නට වෑයම් කෙළමු.

උන් වහන්සේලාගේ සැබෑ කතා අසන විට එක පැත්තකින් ජිවිතය පිළිබදව අවෙබෝධයකුත් අපට අප ගැන නැවත සිතා බලන්නට අවස්ථාවකුත් උදාකර දී තිබේ. අපට ශිල සුව අරණ පුරා සැරි සරන විට දැකගත හැකිවු විශේෂිතම කාරණයක් වුයේ ගිලන් වු භික්ෂුන්ට ආදරෙයන් ඇප උපස්ථාන කරන තරුණ සේවක මඩුල්ලක්ද දක්නට ලැබිමයි. ජිවිතයේ හරය පිලිබදව තරුණ පරම්පරාවට වැ-ටහීමක් නැතැයි චෝදනා නැගෙන සමයක මෙම තරුණයන්ගේ උතුම් කල් ක්‍රියාව මුලු රටටම ආදර්ශයකි.

ගිලන් භික්ෂුන්ට කැවීම පෙවීම පොඩි ළමයින්ටත් වඩා අමාරු දෙයක් යැයි මට සිතුනේ ශිල සුව අරණේ සංජිව ප්‍රසාත් එක්තරා වයස්ගත ගිලන් භික්ෂුවකට කවන්නට ගන්නා උත්සාහය දැකිමෙනි. ඒ භික්ෂුවට කෑම ගැනීම දිගින් දිගටම ප්‍රතික්ෂේප කරන්නේ බොරු ලෙඩක් ඇගට ගැනීමෙනි. භික්ෂුවකගේ ස්වරූපය දන්නා නිසාදෝ ප්‍රසාත් ද උත්සාහය අත් හරින බවක් පෙනන්ට නැත. අවසා-නෙය් ප්‍රසාත් ජය ලබයි.

මෙම සිදුවීම ශිල සුව අරණට දානය දෙන්නට හා වෙනත් අවශ්‍ය දෑ සපයන්නට පැමිණි බොහෝ දෙනාගේ අවධානයට ලක් වු බවත් පෙනන්නට තිබිණ. මේ ළමයි වයසක හාමුදුරුවරු හරි ආදරේන්ලු බලාගන්නේ ඔය ප්‍රසාත් රෑට බුදිය ගන්නෙත් දොර පාමුලලු. ඒ හාමුදුරුවන්ට රෑට මොකක් හරි වුවමනාවක් වෙයි කියලා. සමහර වේලාවට හාමුදුරුවරු වමනේ දාන කොට මේ ළමයි අතලු අල්ලන්නේ .මේ මට මිනිස්සු කියපු කතා වලින් ඇසුණු කතා එකක් දෙකක් පමණි. මෙ-වැනි කතා බොහොමයක් ශිල සුව අරණේ කෙටි ඉතිහාසය තුළ ඇති බවට සැක නැත. තවමත් ගලිගමුවේ ඤාණදීප ස්වාමිණ් වහන්සේ එළියට වැඩම කළේ නැත. උන් වහන්සේ ශිල සුව අරණට ද්‍රව්‍යමය ආධාර කරන්නට පැමිණි පිරිසකට පින් අනුමෝදනාවන් කරමින් සිටිති. පින් කැමැති සැමටම එය විවෘතය. ගිලන් භික්ෂුණ්ට අවශ්‍ය බෙහෙත් ද්‍රව්‍ය, දාන පුජා කිරීම, වෛද්‍යවරුන්ගේ සේවය ලබාදීම, කසාය උණු කිරීම, බෙහෙත් වට්ටෝරු සොයා දීම, ගිලන් මධ්‍යස්ථානයේ නඩත්තුවට දායක වීම, දේශිය හා බටහිර ඖෂධ වර්ග සපයා දිම වැනි අපට හැකි මට්ටමින් කළ හැකි බොහෝ දේ මෙහි තිබෙන බව වටහා ගැනිමට අපහසු නොවිණි.

ගිලන් භික්ෂු මධ්‍යස්ථානයේ දෙවන අදියරද ඉදික-රන්නට ආරම්භ කර තිබේ. ගිලන් භික්ෂුන් හට නේ-වාසිකව ප්‍රතිකාර ලබන්නට ඉදිකෙරන ගිලන් කුටි 25 කින් එය සමන්විතය. එසේම ඉදිරියේදී මීට සමගාමීව ආයුර්වේද රෝහලක් ද ඉදිකිරීම ඤාණදීප හිමියන්ගේ අපේක්ෂාව බව අපට පැවසුවේ මෙහි සේවය කරන සේවකයෙකි. වර්ග අඩි 8000 කට අධික මෙම ගිලන් භික්ෂු ප්‍රතිකාර මධ්‍යස්ථානය ඉදිකිරිම සඳහා ලක්ෂ 200 කට අධික මුදලක් ඇස්තෙමින්තු ගත කර තිබේ. මෙහිදි තමන්ට හැකි පමණින් ගිලන් භික්ෂු උපස්ථාන ගොඩනැගිල්ලට ආධාර කරන්නට මෙන්ම ද්‍රව්‍යමය වශයෙන් සිමෙන්ති වැලි, ගල්, ගඩොල්, ආදීයෙන්ද දායක වියහැකිය. එසේම ගිලන් භික්ෂුන් උදෙසා ගිලන් ඇදන්, සනීපාරක්ෂක උපකරණ ,බෙහෙත් ද්‍රව්‍යය සැපයිය හැකිය. ශිල සුව අරණ පිළිබද විස්තර ඇතුලත් පොතක් අප අතට ලැබුණේ අප ගිලන් මධ්‍යස්ථානය පිළිබදව තොරතුරු සෙවිමේ අපේක්ෂාවෙන් බෙමොබ සැරිසරමින් සිටියදීය. ගිලන් භික්ෂු උපස්ථාන පින් පොත ලෙස හදුන්වා දී තිබු එහි බුදුවරයෙකුට උපස්ථාන කළා සේ පින් රැස්වෙන ගිලනුන් හට සිදුකළ හැකි ගිලානෝපස්ථානය පිළිබද බොහෝ කරුණු ඇතුළත්ව තිබේ. පිටුවෙන් පිටුව පෙරළන විට හමුවන්නේ අංගුත්තර නිකායේ ගිලාන සුත්‍රයේ සදහන් ගිලන් භික්ෂුවක් කරුණු පහක් වඩමින් කටයුතු කළ යුතු අයුරුය. එසේම ගිලන් උපස්ථායකයකු තුළ තිබිය යුතු ගුණාංග මෙන්ම ගිලන් භික්ෂුන්ට බෙහෙත් පුජා කිරීමේදී බුදුන් වදාළ ආනිසංසයන්ද මෙහි දක්වා ඇත.

අපට බලන බලන පැත්තෙන් පෙනෙනුයේ ඤාණදීප හිමියන්ගේ අප්‍රතිහත ධෛර්යයෙන් වසර දෙකක් වැනි කෙටි කාලයක් තුළ ගොඩනැගුණු මහා දැවැන්ත ගිලන් මධ්‍යස්ථානයේ රමණියත්වයයි. මේ ස්ථානයට පැමිණෙන සැවොම වශිවනවාට සැක නැත. අප ශිල සුව අරණට පැමිණියේ හොරණ රත්නපුර පාරේ හොරණ නගරය පසු කර සැතපුමක් පමණ පාදුක්ක දෙසට ගමන් කොට දකුණට හැරී දික්හේනපුර පාරේ සැතපුම් දෙකක් මග ගෙවාය. එතැනින් වෙල්යාය මැදින් වමට පිහිටි මාවතේ මිටර් 500 ක් දුර එන විට නිස්කලංක පරිසරයක ශිල සුව අරණ නම් ගිලන් භික්ෂු මධ්‍යස්ථනය පිහිටා තිබෙන බවට ඔබට මතක් කළ යුතුය.

මේ ගෞතම බුද්ධ ශාසනයට ශ්‍රද්ධාතින් සියලු ගිහි සැප හැර දමා කෙනකු පැමිණෙන්නේ නම් එය උතුම් පරිත්‍යාගයකි. එසේම නිවන් අවෙබෝධ කොට සසර දුකින් මිදිම සදහා එන භික්ෂුණ් වහන්සේලා වයස්ගත ගිලන් වු කළ අසරණ වන අයුරු අපගේ දෑස් ඉදිරිපිටම දක්නට ලැබිම ඛේදවාචකයකි. එම භික්ෂුණ්ට නොමිලේ සියලු වෛද්‍ය පතිකාර ලබාගනිමින් කිසිදු නිකාය භේදයකින් තොරව මෙම ගිලන් භික්ෂු මධ්‍යසථානය විවෘත කර තිබේ. බොහෝ විට මෙහි වැඩ සිටින්නේ ආරණ්‍යගතව මිල මුදල් පරිහරණයෙන් වැලකී හුදකලා වී පිණ්ඩපාතික ජිවිත ගතකරමින් සිටි සිල්වත් නැණවත් භික්ෂුන් වහන්සේලාය. ගිලන්ව කිසිදා හවිහරණකට හසු නොවු බෙහෙතක් ගැන-ීමටවත් මුදල් අතේ ඉතිරි නොවු භික්ෂුහුය.

ශිල සුව අරණේ සියලු පහසුකම් මෙම භික්ෂුණ්ට හිමිය. වෛද්‍ය කාමර, ෆාමසියක්, හදිසි පතිකාර ඒකකයක්, පංචකර්ම ආයුර්වේද පතිකාර ද එකම ගොඩනැගිල්ලක් තුළ මෙම භික්ෂුණ්ට හිමි වේ. ගිලන් භික්ෂුණ්ට නොමිලේ ලබාදෙන මෙම සියලු සේ-වාවන්ට මසකට ලක්ෂ හයකට අධික මුදල් වැය වන බව කිවේ ඤාණදීප ස්වාමිණ් වහන්සේය. ඉදිරියේදී ගිලන් භික්ෂුණ් ගණන තවත් වැඩිවෙන විට එය තවත් වැඩිවෙනු ඇත. යමෙකු ගිලනුන් හට උපස්ථාන කරයිද, ලොව්තුරා බුදුවරයෙකුට උපකාර කලා වැනියැයි පාඨයේ අර්ථය අපගේ දෑස් ඉදිරිපිටම විද්‍යාමන වේ. ඔබට ශිල සුව අරණේ යාවජිව සාමාජිකත්වය ලබා මසකට රුපියල් දාහක් සුලු මුදලක් ලබා දී මෙම පිංකම හා එකතු විය හැකිය. ශිල සුව අරණේ දී අපට ඇසුනු කතා මෙන්ම දැකපු දේවල් බොරු කළ නොහැක. ඒවායේ සත්‍යවාදීබව අත්විදින්නට නම් ඔබ එක් දිනයක් ශිල සුව අරණට ගොස් අපගේ ගෞරවනීය ගිලන් භික්ෂුණ් ජිවිතය ගත කරන ආකාරය දැක බලා ගන්නට මම ඔබට යෝජනා කරමි. අප හැමගේම ප්‍රාර්ථනය බියකරු මේ සසර කත රයෙන් මිදී ලොව්තුරු නිවන් සුව ලබාගැනිමටය. සසරේ සැරි සරණ මොහොතේ අපගේ ප්‍රාර්ථනය අල්ප ආබාධ ඇතිව ඉපදීමය. බක්කුල මහරහතන් මෙන් නිරෝගී උතුම් නිවන් සුව විදිමය. එහෙත් ඒ නිරෝගී සම්පත්තිය ප්‍රාර්ථනාවකින් පමණක් ලැබීය හැක්කක් නොවන බව අප බොහෝ දෙනක් අමතක කර තිබෙන කාරණයයි. මනුෂ්‍යත්වය බොහෝ සිත් සතන් තුළින් වියකී ගොස් තිබෙන්නේ ඒ නිසාය. ගිලානුඋපස්ථානය පින් දහම් සිදු කොට ප්‍රායෝගිකව කිරීමට අප වග බලා ගත යුතුය. යහපත් කර්මයන්ගේ විපාක යහපත් ප්‍රතිපල තමන් වෙතම ලැබේ. ඒ බව අප වටහා ගත යුතුය. පින් කැමැති ඔබට මම ශිල සුව අරණේ නඩත්තුව වෙනුවෙන් දායක විමට මගක් කියමි. ඒ ගලිගමුවේ ඤාණදීප හිමියන්ගේ ගිණුම් අංක පහත සදහන් කරමිනි. ඔබට ඒ ගිණුම් වලට හැකි පමණින් දායක විමට හැකි නම් ඔබට ගෞතම බුදු මග යන උතුම් බුද්ධ පුත්‍රයෙකු බවට පත් විය හැකි බව විශ්වාසයෙන් කියමි.











මහජන බැංකුව - බත්තරමුල්ල- 208 2001 34825 334
හැටන් නැෂනල් බැංකුව-අතුරුගිරිය- 1540 2005 9835
සම්පත් බැංකුව- කෑගල්ල - 10645328824 1

මේ සියලු ගිණුම් තිබෙනුයේ ගලිගමුවේ ඤාණදීප හිමි නමිනි. ශිල සුව අරණට මුදල් එවේලේ භාර දුන්නත් රිසිට් පතක් ඔබට ලැබේ. එසේ ඔබ විමසන්නට යමක් වේ නම් 0718671086 , 0115753987 යන දුරකථන අංක වලින් විමසිය හැකිය. මෙවැනි තැනකට ගිය විට ජිවිතයේ අපි දකින අස්ථාවරත්වය පිළිබදව අපට නැවත වරක් සිතන්නට අපව පොළඹවා තිබේ. සමහර තැන් වලට ගිය නැවත ඒ තැන් වලට යා යුතු යැයි අපට සිතුනත් ඒවා ඒ ආකාරයටම සිද්ධවන්නේ නැත. එහෙත් ශිල සුව අරණට නම් කෙසේ හෝ නැවත දවසක් යා යුතුය.

පොත පත දෙසට හෙලන විමසුම් ඇස

**"සාහිත්‍ය සම්භාෂණ"**

ඕස්ට්‍රේලියා වාසී ශ්‍රී ලාංකික ලේඛක ලේඛිකාවන්ගේ නිර්මාණ හඳුන්වා දෙන
ජගත් ජේ එදිරිසිංහ සමග දිනේෂා දිල්රුක්ෂි විජේසූරිය ඉදිරිපත් කරන
"සාහිත්‍ය සම්භාෂණ"

**එස්බීඑස් ගුවන් විදුලියේ සිංහල සේවයෙන්**

දෙමසකට වරක් අවසන් අඟහරුවාදා දහවල් 11 ට FM93.1.
අන්තර්ජාලයෙන් www.sbs.com.au/yourlanguage/sinhalese/